# වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පුරවැසි ප්‍රඥප්තිය

# <u>වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පුරවැසි ප්‍රඥප්තිය</u>

## ඔබ විසින් දැන් ප්‍රවේශ වන්නේ ඔබට සේවය කිරීමට සූදානම්ව සිටින ස්ථානයකටයි

## <u>අපගේ මෙහෙවර</u>

වයඹ ජනතාවට වඩාත් උසස් ජීවන තත්වයක් උදාකරදීමේ කර්තව්‍යයට උරදීම සඳහා බදු ගෙවන ජනතාවට හා ආර්ථිකයට වඩාත් ප්‍රතිලාභ ලැබෙන අයුරින් ආදායම් උපායමාර්ගයන්ට අදාල බලතල ක්‍රියාවට නැංවීම

## <u>අපගේ දැක්ම</u>

"වයඹ පළාත වෙනුවෙන් සකස් කර ඇති ආදායම් උපාය  මාර්ග පිළිබඳ නීති ක්‍රියාත්මක කිරිම තුලින් වයඹ ජනතාවට උසස් ජීවන තත්වයක් ලබා කර දී වයඹ සංවර්ධනයේ කොටස්කරුවන් වීම"

අපගේ කැපවීම:-

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාරසම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂයමූලිකව හා අපක්ෂපාතීව
- විනිවිදභාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කාර්යක්ෂමව හා සපලතාවයෙන්  ලබා දීමට කැපවී සිටන්නෙමු

| ලබා දෙන සේවය | සේවය ලබා දීමේ ප්‍රමිති (පැය /දින/සති) | අදාල නීති , සංග්‍රහය, රෙගුලාසි ආදිය | ඉදිරිපත් කලයුතු තොරතුරු/ලේඛන (සම්පූර්ණ කල යුතු ආකෘතිපත්‍ර , එම ආකෘතිපත්‍ර ලබා ගත හැකි ස්ථාන , ගෙවිය යුතු ගාස්තුවක් ඇත්නම් එය ගෙවිය යුතු කවුළු පිහිටි ස්ථානය යනාදී විස්තර | ඔබට උදව් ලබා ගත හැක්කේ( නිලධාරියාගේ නම , තනතුර, ස්ථානය, දුරකථන/ෆැක්ස් /විද්‍යුත් තැපැල |
|---|---|---|---|---|
| 1.සාධනපත්‍ර පරීක්ෂණයට පුද්ගලයින් පැමිණි විට | සියළු තොරතුරු ඇති විට විනාඩි 30 | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 73 (8) (අ) (ආ) (ඇ) වගන්ති | 1. ලියාපදිංචි ඔප්පුවේ පිටපතක්<br>2. මානක සැලැස්මේ පිටපතක්<br>3.ගොඩනැගිල්ලක් ඇත්නම් සැලැස්මේ පිටපතක්<br>4. බැංකු තක්සේරුවක් ඇත්නම් පිටපතක්<br>5. වරිපනම් තක්සේරු ඇත්නම් පිටපතක්<br>6.අදාල වෙනත් ලියවිලි<br>(කැඳවා ඇති වේලාවට පැමිණ සිටීම) | කැඳවීම් කර ඇති නිලධාරීයා |
| පරීක්ෂණය සඳහා වැඩිමනත් තොරතුරු වාර්තා හා ලේඛන අවශ්‍ය යැයි තක්සේරුකරු තීරණය කල අවස්ථාවක | විනාඩි 30 | | 1.එම ඉදිරිපත් කල යුතු ලේඛන හා වාර්තා ඉදිරිපත් කිරීම( ඉල්ලන ලද ලේඛන හා වාර්තාවල සත්‍යායනය කරන ලද හෝ මුල් පිටපත් ඉදිරිපත් කිරීම) | පරීක්ෂණය මෙහෙයවන තක්සේරුකරු |
| තීරණය ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් අවශ්‍ය බවට තක්සේරුකරු තීරණය කරන විටක හෝ ක්ෂේත්‍ර | ක්ෂේත්‍ර පරීක්ෂණය අවසන් දින සිට කාර්යාල දින 14 ක් තුල | | 1.දේපල වෙත ළඟාවිය හැකි කෙටිම මාර්ගය පිළිබඳ සැලැස්මක් ලබා දීම<br>2. සම්බන්ධ කල හැකි දුරකථන අංක ලබා දීම | ක්ෂේත්‍ර පරීක්ෂණයට බලයලත් නිලධාරීයා |

| | | | | |
|---|---|---|---|---|
| පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලා සිටින විට | | | **ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාවේදී අදාල අය හෝ නියෝජිතයෙකු පැමිණ සිටීම** | |
| **2.** ගෙවීම් කරන ලද සාධන පත්‍ර නිසි පරිදි ගෙවීම් කර ඇති බවට පිටසන් කර ගැනීම | විනාඩි 10 | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 58 (1) හා (2) වගන්ති | 1. සම්පූර්ණ ගෙවීම් අවසන් කර ඇති බවට ගෙවීම් රිසිට් පත්<br><br>2. මුල් ඔප්පුව | සහතික කිරීමට බලයලත් නිලධාරියා |
| **3.** අභියාචනා කිරීම<br><br>තක්සේරුකරුවකු විසින් නිකුත් කරන ලද තක්සේරුවකට හෝ මතයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් වූ විට අභියාචනා කිරීම | සියළු කරුණු සම්පූර්ණ කර ඇති විටක දින 30 ක කාලයක් | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 79 (1) (2) (3) (4) (5) (6) (7) (8) (9) (10) (11) (12) (13) වගන්ති | 1.අභියාචනය කොමසාරිස් අමතා අදාල ලේඛන සහිතවලිඛිතව ඉදිරිපත් කිරීම<br><br>2.තක්සේරුව හෝ මතයේ පිටපතක් ඉදිරිපත් කිරීම<br><br>3.අභියාචනය විසඳීම සඳහා පාදක කර ගත හැකි තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරිම<br><br>**අදාල තක්සේරුව හෝ මතය ලබාදී දින 30 ක් ඇතුලත අභියාචනය ඉදිරිපත් කල යුතුයි.** | කොමසාරිස් |
| සමාලෝචන මණ්ඩලයට අභියාචනා කිරීම | | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 80 (1) (2) (3) (4) (5) , 81 (1) (2) (3) , වගන්ති | කොමසාරිස් විසින් ලබා දුන් තීන්දුව ලබාදුන් දින සිට සතියක් තුල | කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| අභියාචනා අධිකරණයට අභියාචනා කිරීම | | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 84 (1) (2) (3) (4) (5) (6) (7) වගන්ති | සමාලෝචන මණ්ඩලයේ තීරණය අභියාචක වෙත ලබාදුන් දින සිට එක් මාසයක් ඇතුලත<br><br>ගාස්තුව රු 50/- | අභියාචනා මණ්ඩලයේ ලේකම් |
| විරෝධතා ඉදිරිපත් කිරීම | 57 (1) ආ වගන්තිය යටතේ යම් අභියාචනයක් කර නැති විටක | 87 (1) (2) | බද්ද අය කිරීම සම්බන්ධයෙන් රතු නිවේදනය ලැබී දින 30 ක් තුල ඉදිරිපත් කල යුතුයි. | කොමසාරිස් |
| **4.** දේපල වටිනාකම් සඳහා මත ප්‍රකාශ ලබා දීම | පැය 02 | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 62, 63, 64 (2) (අ) (ආ) වගන්ති | 1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය<br><br>2.දේපල සඳහා ලියාපදිංචිය සහිත මුල් ඔප්පුවේ පිටපතක්<br><br>3.පැවරුම් ඔප්පුවේ කෙටුම්පතක්<br><br>4.දේපලට අදාල මිනින්දෝරු සැලැස්ම<br><br>5.ගොඩනැගිලි ඇත්නම් ගොඩනැගිලි සැලැස්ම<br><br>6.විකුණුම් ගිවිසුමක් හෝ බැංකු තක්සේරුවක් ඇත්නම් එහි පිටපතක්<br><br>**දේපල ගැනුම්කරු හෝ දේපල පිළිබඳව නිසි දැනුමක් ඇති නියෝජිතයෙකු ඉදිරිපත් විය යුතුයි** | කොමසාරිස් මගින් තක්සේරුකරු |
| මතය ලබාදීමට වැඩමනත් තොරතුරු අවශ්‍ය යැයි තක්සේරුකරු තීරණය කල විට | පැය 02 | | 1.තක්සේරුකරු විසින් සපයන ලෙස ඉල්ලා ඇති තොරතරු හා ලේඛන **සත්‍යායනය කරනු ලබන ලේඛන හෝ මුල් පිටපත් ඉදිරිපත් කල යුතුයි** | පරීක්ෂණය මෙහෙයවන තක්සේරුකරු |

| | | | | |
|---|---|---|---|---|
| මතය ලබා දීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කල යුතු යැයි තීරණය කල අවස්ථාවක | ස්ථාන පරීක්ෂාවෙන් පසු පරීක්ෂණ දිනයේම හෝ ඊලඟ කාර්යාල දිනය තුල | | 1.ඉඩමට ලඟාවිය හැකි කෙටිම මාර්ගය පිළිබඳ සැලැස්මක්<br><br>2.සම්බන්ධ කල හැකි දුරකථන අංක | බලයලත් ක්ෂේත්‍ර පරීක්ෂණ නිලධාරියා |
| 5. මත සහතික කිරීම<br><br>මත ඉල්ලුමකින් ලබා ගත් මතයක් මත ලියන ලද ඔප්පුවක් සහතික කිරීම | විනාඩි 10 | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 62, 63 වගන්ති | 1.අදාල මත ප්‍රකාශය පරිදි ගාස්තු ගෙවූ රිසිට්පත පිටපතක් සමඟ<br><br>2.ලියාපදිංචි කල හෝ ලියපදිංචි කිරීමට සූදානම් කර ඇති ඔප්පුව හා පිටපතක් | කොමසාරිස් / මත සහතික කිරීමට බලයලත් නිලධාරියා |
| 6. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කරන ඔප්පු සහතික කිරීම | විනාඩි 30 | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 62 (2)(අ) (ආ) වගන්ති | 1. ලියපදිංචි කරන ලද හෝ ගාස්තු ගෙවන ලද සාධන පත්‍රය සහ පිටපතක්<br><br>2.දේපලට අදාල මිනින්දෝරු සැලැස්ම<br><br>3.නීත්‍යානුකූල බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් මඟින් නිකුත් කල සත්‍යායනය කරන ලද තක්සේරු වාර්තාවේ පිටපතක්<br><br>4.ලියපදිංචි කරන ලද විකුණුම් ගිවිසුමක් හෝ දේපල වටිනාකම පිළිබඳව තීරණය කල හැකි වෙනයම් නීත්‍යානුකූල ලියවිල්ලක්<br><br>**මෙසේ ඉදිරිපත් කරන ඔප්පු ලියපදිංචි කල දින සිට වර්ෂයක කාලයක් තුල ඉදිරිපත් කල යුතුයි** | කොමසාරිස් |
| 7.ආදායමෙන් ආපසු ගෙවීම<br><br>වැරදීමකින් | මෙහි සඳහන් ලේඛන ලැබීමෙන් පසු අදාල ගෙවීම් | 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 65 | 1.මුද්දර ගාස්තු ගෙවන ලද ඔප්පුවේ ඉඩම් රෙජිස්ට්‍රාර් සහතික කල පිටපතක්<br>2.මුදල් ගෙවන ලද රිසිට් | තක්සේරුකරු |

| | | | | |
|---|---|---|---|---|
| අනවබෝධයකින් හෝ වෙනත් පළාතකට අදාල ගාස්තුවක් ගෙවීමකදී හෝ ප්‍රතිෂ්ඨාවකට වඩා වැඩියෙන් ගාස්තු ගෙවීමකදී ආපසු ගෙවීමක් ඉල්ලා සිටිය හැක | බැංකු ප්‍රකාශන සමඟ පරීක්ෂා කර බලා ලැබීම් තහවුරු කරගෙන සති 02 ක් තුල ආපසු ගෙවීම අනුමත කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත ඉදිරිපත් කරනු ලැබේ. | (1)(අ) (ආ) (ඇ) (2) (3) (4) වගන්ති | පතේ මුල් පිටපත සහ දෙවන පිටපත<br>3.දෙවරක් ගෙවීමකදී නම් ඔප්පුවේ දෙවන පිටපතට අලවන ලද පිටපතේ දෙවන පිටපත<br>4.ඉල්ලීම් ලිපිය<br>5. සිදු වීම පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක්<br>__සැලකිය යුතුයි__<br>**1.එම ගෙවීම සිදු කර වසරක් ගෙවීමට පෙර ආපසු ගෙවීම සඳහා ඉල්ලුම් කල යුතුයි.**<br>**2.වැඩිපුර ගෙවීමකදී නම් වසර 03 ක් ඇතුලත ඉල්ලීම් කල යුතුයි.** | |
| 8. පළාත් පාලන ආයතන වෙත මුද්දර ගාස්තු නිදහස් කිරීමට නිර්දේශ කිරීම | සති 02 | | 1.ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් ලබා දෙනු ලබන ඉඩම් ලියාපදිංචි කරන ලද උපලේඛන<br>2. ඉල්ලීම් ලිපිය | කොමසාරිස් |

__පැමිණිලි හා  සහන ලබාදීම් ක්‍රමවේදය__

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාරසම්පන්නව අවශ්‍ය උපකාර හා සේවාවන් ඔබට ලබා දෙනු ලැබේ. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධව ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත සෘජුවම හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ දන්වන්න.

නම:- එච්.ඒ.ඩී.හෙට්ටිආරච්චි
තනතුර:- පළාත් ආදායම් කොමසාරිස්
ස්ථානය:- වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
පළාත් සභා කාර්යාල සංකීර්ණය
කුරුණෑගල
දුරකථන අංකය :- 037-2223806

නම:- ආර්.ඩී.එස්.ගුණවර්ධන
තනතුර:- තක්සේරුකරු
ස්ථානය:-වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
පළාත් සභා කාර්යාල සංකීර්ණය
කුරුණෑගල
දුරකථන අංකය :- 037-2227633

සියළු පැමිණිලි ලද බව දින 14 ක් ඇතුලත දන්වන අතර අවසාන පිළිතුර දින 45 ක් ඇතුලත දන්වනු ලැබේ.

## මෙම කාර්යාලය අල්ලස හෝ දූෂණයෙන් තොර ස්ථානයකි

පුරවැසි ප්‍රඥප්තිය අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ඔබගේ යෝජනා හා අදහස් අගේ කොට සලකමු.

ප්‍රඥප්තිය යටතේ ලබා දෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට හා වැඩිදියුණු කිරීමට අපි බැඳී සිටිමු.